International Labour Organization

# ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා වූ සම්මත රැකියා ගිවිසුම

## පිටත සිට ගෘහසේවා සැපයීමට සේවායෝජක වෙත පැමිණෙන ශ්‍රමිකයින් සඳහා

මෙම ආදර්ශ ගිවිසුම දේශීය නීති සහ ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් විශ්ලේෂණය කිරීමෙන් සකස් කරන ලදී. එය උපදේශන මෙවලමක් සහ සාකච්ඡාව සඳහා පදනමක් ලෙස සකසා ඇත. සේවායෝජකයින් සහ සේවකයින් අතර ගිවිසුමක් ලෙස භාවිතා කිරීම සඳහා, එය අනුවර්තනය කළ හැකි නමුත්, මුල් පිටපතට සමාන වන ලෙස සකස් කරගැනීමට ජාත්‍යන්තර කම්කරු සංවිධානය නිර්දේශ කරයි. ශ්‍රී ලංකාවේ කම්කරු නීතිවල ගෘහ සේවකයින් සඳහා නිශ්චිත විධිවිධාන නොමැති වුවද, පවතින නීති, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ සමානාත්මතාවය සහ මානව හිමිකම් මත පදනම් වූ අපරානුමත කරන ලද ජාත්‍යන්තර ප්‍රමිතීන් ඔවුන්ගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා අර්ථ නිරූපණය කළ හැකිය.

සේවා යෝජකයින් අනුගමනය කළයුතු ප්‍රධාන පියවරයන්:

- දේශීය නීති, රෙගුලාසි සහ සාමූහික ගිවිසුම් වලට අනුකූල වීම සහතික කිරීම.
- සේවකයා සමඟ ගිවිසුමේ නියමයන් සාකච්ඡා කිරීම.
- දෙපාර්ශවයටම භාෂාව තේරුම් ගතහැකිබව සහතික කරමින් සිංහල හෝ දෙමළ භාෂාව භාවිතා කිරීම
- රැකියා නියමයන් ගෙනහැර දක්වන පැහැදිලි, ලිඛිත ගිවිසුමක් ලබා දීම.
- සාක්ෂරතා අභියෝග ඇති සේවකයින්හට විශ්වාසදායක තෙවන පාර්ශවයකින් උපකාර ලබා ගැනීමට ඔවුන් දිරිමත් කිරීම.

**දකුණු පස ඇති යොමු කොටු වල දක්වා ඇති ශ්‍රී ලාංකික නීති සහ ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්හී සම්පූර්ණ නාමය / මාතෘකා සඳහා කරුණාකර ඇමුණුම් 4 සහ 5 බලන්න.**

## 1. මෙම රැකියා ගිවිසුමෙහි පාර්ශවයන්

මෙම රැකියා ගිවිසුම ක්‍රියාත්මක කර අත්සන් කරනු ලබන්නේ,

1.1 සේවායෝජකයා

සම්පූර්ණ නම : ..........................................................................................

ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍ර අංකය : ..........................................................................

ලිපිනය : ..........................................................................................

දුරකථන අංකය : පදිංචිය .............................. ජංගම දුරකථනය : ..............................

සහ

1.2 සේවකයා

සම්පූර්ණ නම : ..........................................................................................

ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍ර අංකය : ..........................................................................

ලිපිනය : ..........................................................................................

දුරකථන අංකය : පදිංචිය .............................. ජංගම දුරකථනය : ..............................

☐ රැකියා ගිවිසුමට ඇතුළු වන දිනට ඇයට/ඔහුට වයස අවුරුදු 18 හෝ 18 ට වැඩි බව සේවකයා සහතික කර සිටී.
(කරුණාකර කොටුව සලකුණු කරන්න)

සේවායෝජකයා විසින් රැකියා නියමයන් සහ සේවායෝජකයාගේ නම සහ ලිපිනය සඳහන් පැහැදිලි, තේරුම්ගත හැකි රැකියා ගිවිසුමක් සේවකයාට ලබා දිය යුතුය.
**S&OE පනතේ 15 (1) ,15 (2) වන වගන්ති; C.189 7(c) වන වගන්තිය**

වයස අවුරුදු 18 ට අඩු පුද්ගලයින් ගෘහ සේවකයින් ලෙස සේවයේ යෙදවිය යුතු නොවේ.
**EWY&C පනත (HOR) 2021/1 කොටස Reg2(i)**

ළමයින් හානිකර සහ අන්තරාකාරීය රැකියාවන්හි යෙදවීමෙන් වැළැක්විය යුතුය.
**CRC 32 වන වගන්තිය; C.182 & C.138**

## 2. හදිසි අවස්ථාවකදී දැනුම් දියයුතු පුද්ගලයා

2.1 නම : ..........................................................................................

2.2 සේවකයා සමග ඇති සම්බන්ධතාවය : ..........................................................................

2.3 ජංගම දුරකථන අංකය : ..........................................................................................

හදිසි අවස්ථාවකදී දැනුම්දිය හැකි සම්බන්ධතාවයක් සඳහන් කිරීම යහපත් භාවිතයකි.

## 3. සේවා කාලය

3.1 මෙම රැකියාව .............................. දින ආරම්භ වී .............................. දින අවසන් වේ.

3.2 මෙම රැකියා ගිවිසුමේ කාලසීමාව : .......................................................... මාස/අවුරුදු

රැකියාවේ සේවා කාලය සහ කාල සීමාව, නිශ්චිතව දැක්විය යුතුය.
**S&OE පනත (RER) 15 (1) ,15 (2) සහ 17 වගන්ති; C.189 7(c) වන වගන්තිය**

## 4. රැකියා ස්ථානය

4.1 ලිපිනය : ..........................................................................................

(මෙය සේවා යෝජකයාගේ ඉහත සඳහන් කළ ලිපිනයම විය යුතුය)

රැකියා ස්ථානයේ ලිපිනය ඇතුළු රැකියා පිළිබඳ විස්තර සැපයිය යුතුය.
**S&OE පනත (සංශෝධිත) 1 ඛාණ්ඩය (RER) 17 වන වගන්තිය, C.189 7(b) වන වගන්තිය**

# 5. රැකියා වර්ගය සහ රැකියා විස්තරය

5.1 රැකියා වර්ගය : ..........................................................................................

(කරුණාකර ඇමුණුම 1 හි සඳහන් රැකියා වර්ග බලන්න)

5.2 රැකියා විස්තරය : ..........................................................................................

(කරුණාකර ඇමුණුම 2 - රාජකාරී ලැයිස්තුව සම්පූර්ණ කර රැකියා ගිවිසුමට අමුණන්න)

5.3 ඇමුණුම 2 අනුව එකඟ වූ රාජකාරීන්හි යම් වෙනස්කම් සිදුකිරීමට පෙර සේවායෝජකයා, සේවකයාගේ එකඟත්වය ලබා ගත යුතුය.

නියමිත රාජකාරි සඳහා කරනු ලබන සියලුම සංශෝධන සහ පවරනු ලබන ඕනෑම අමතර කාර්යයක් ඇමුණුම 2 හි සටහන් කළ යුතුය.

සේවකයෙකුගේ රැකියා වර්ගය සහ රාජකාරිවල ස්වභාවය නිශ්චිතව ඇතුළත් කළ යුතුය
**S&OE පනත, 1 ඛාණ්ඩය 17 වගන්තිය, C.189 7 (d), 1(a), (b) වන වගන්ති සහ නිර්දේශ 201 - 6 ඡේදය (2) a**

# 6. වැටුප් සහ ප්‍රතිලාභ

6.1 සේවකයාට පහත අනුපාතයට වැටුප් ගෙවනු ලැබේ. රු. ..................................................
දිනකට/සතියකට/මාසයකට (කරුණාකර අදාළ ක්‍රමවේදය ලකුණු කරන්න)

6.2 සේවායෝජකයා පහත සඳහන් පදනම මත වැටුප් ගෙවීමට එකඟ වේ.

(කරුණාකර අදාළ කොටුව සලකුණු කරන්න)

- ☐ සතිපතා සෑම සතියකම ............................................ දින දී (දිනය සඳහන් කරන්න)
- ☐ දෙසතියකට වරක් .................................................... දින දී (දිනය සඳහන් කරන්න)
- ☐ මාසිකව .................................................................. දින දී (දිනය සඳහන් කරන්න)
- ☐ දිනපතා .................................................................. දින දී (දිනය සඳහන් කරන්න)

6.3 ගෙවීමේ ක්‍රමය (කරුණාකර අදාළ කොටුව සලකුණු කරන්න)

- ☐ මුදලින් ගෙවනු ලැබේ
- ☐ සේවකයාගේ බැංකු ගිණුමේ තැන්පත් කරනු ලැබේ

6.4 අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ පරිදි පහත සඳහන් ප්‍රතිලාභ සේවකයාට හිමවේ.

අ) ආහාර හෝ ආහාර දීමනාව : රු. ..........................................................................

ආ) නවාතැන්

6.5 සේවායෝජකයා විසින් සේවකයාගේ වැටුප වාර්ෂිකව සමාලෝචනය කර වැඩි කළ යුතුය.

6.6 සේවකයාගේ වැටුපෙන් කරනු ලැබෙන අඩු කිරීම් සඳහා සේවකයා එකඟවිය යුතුය.

6.7 එකඟ වූ වැටුප ගෙවීමේදී දෙපාර්ශ්වයේම අත්සන් සහිත ලේඛනයක් සේවායෝජකයා සහ සේවකයා විසින් පවත්වා ගෙන යායුතුය.

(කරුණාකර ඇමුණුම 3 සම්පූර්ණ කරන්න - වැටුප් ගෙවීම් වාර්තාව)

ගෘහ සේවකයන්ටද, අනෙක් සේවකයන්ට මෙන්ම, අනුමත අවම වැටුප හෝ ඊට වැඩි වැටුපක් මුදලින් ගෙවිය යුතුය.
**C.**189 7**(e)** වන වගන්තිය සහ **(h)** වන වගන්තිය, 11**(c)** වන වගන්තිය**; C100** සහ **C.111**

- ජාතික අවම මාසික වැටුප - **LKR** 17,500
- ජාතික අවම දෛනික වැටුප - **LKR** 700

**NMWW** පනත වගන්තිය (සංශෝධිත) 3(1) අනුව (දැනට අනුමත අවම වැටුප)

වැටුප් ගෙවීම් කරනු ලබන කාලය සහ ගෙවීම් ක්‍රමවේදය නිශ්චිතව සඳහන් විය යුතුය.
ජ්‍යාතන්තර කම්කරු සංවිධානයේ **C189 7(e)** සහ 12 (1) වන වගන්ති

ද්‍රව්‍යමය ගෙවීම් (උදා: ආහාර හෝ නවාතැන්) වැනි ප්‍රතිලාභ සේවකයාට සැලසිය යුතු අතර ඒ සඳහා අන්‍යෝන්‍ය වශයෙන් එකඟව තිබිය යුතුය.
**C.189 7 (h) සහ 12(2) වන වගන්ති**

ජීවන වියදම සහ/හෝ කාර්ය සාධනය පදනම්ව සාමාන්‍යයෙන් ශ්‍රී ලංකාවේ සේවකයින්ට වාර්ෂික වැටුප් වැඩිවීම් ලැබේ.

බලයලත් අඩු කිරීම් (උදා: ණය, අත්තිකාරම්) සේවකයාගේ වැටුපෙන් 60% නොඉක්මවිය යුතුය.
**S&OE 11 කොටස 18 (1), 19 1 (a) සහ (c) වන වගන්ති**

ආරවුල් විසඳීමට උපකාර වීම සඳහා අත්සන් කරන ලද වැටුප් පත්‍රිකා දෙපාර්ශ්වය විසින්ම තබා ගත යුතුය.
**S&OE පනත (RER) II කොටස 17 සහ 18 වගන්තිය; R.201, ඡේදය 8(1) සහ 15(1); C.189, 12(2) වන වගන්තිය**

# 7. වැඩ කරන වේලාවන්

7.1 අන්‍යෝන්‍ය වශයෙන් එකඟවූ පරිදි සේවය කරන පැය ගණන දිනකට පැය 8 නොඉක්මවිය යුතු අතර අමතර සේවය ලබාගන්නා කාලය සඳහා අතිකාල දීමනා ලබා දිය යුතුය.

7.2 සේවකයා වැඩ කරන දිනක, එකඟ වූ පරිදි පැය ගණන ඉක්මවා යන්නේ නම් ඒ සඳහා සේවකයාට අතිකාල ගෙවීම් ලබා ගැනීමට හිමිකම් ඇත.

7.3 කලින් එකඟ වූ, සතියේ විවේක දිනයකදී සේවකයා සේවයේ යෙදවීමට අවශ්‍ය වන්නේ නම් සාමාන්‍ය පැයකට ගෙවීමට නියමිත මුදල මෙන් දෙගුණයක අනුපාතයකට ගෙවීමක් ලබා ගැනීම සඳහා සේවකයාට හිමිකම් ඇත.

7.4 දිනකට අඛණ්ඩව වැඩ කරන සෑම පැය හතරකට වරක් විනාඩි තිහක කාලයක විවේකයක් ලැබීමට සේවකයාට අයිතිය ඇත.

7.5 සෑම වැඩකරන දින 7 ක කාල පරිච්ඡේදයකටම එකිනෙකා එකඟවූ පරිදි අවම වශයෙන් එක් විවේක දිනයක් සඳහා (අඛණ්ඩ පැය විසිහතරක කාලයක්) සේවකයින්ට හිමිකම් ඇත.

(කරුණාකර දෙපාර්ශවයම එකඟ වූ දිනය ඇතුළත් කරන්න)

7.6 සේවකයාගේ දිනපතා සහ සතිපතා විවේකය, රජයේ නිවාඩු සහ වාර්ෂික නිවාඩු යනාදී වූ ඔවුන්ගේ විවේක කාලය තමා කැමති පරිදි යොදාගැනීමට සහ සේවා ස්ථානයෙන් බැහැරව යාමට සේවකයාට නිදහස ඇත.

සේවය කරන පැය ගණන දිනකට පැය 8ක් හෝ සතියකට පැය 45ක් නොඉක්මවිය යුතු අතර, අතිකාල පැය ගණන උපරිමය සතියකට පැය 12කට සීමා වේ.
**S&OE පනත (RHE) I කොටස 3(1), (RER) I කොටස 3 වගන්තිය**

කාන්තා සේවකයින්ට රාත්‍රියේ වැඩ කිරීමට බල නොකළ යුතුය.
**EWY&C පනත 1 කොටස (රාත්‍රී වැඩ) 2, a(2) වන වගන්තිය**

අතිකාල වැඩ කරන සෑම පැයකටම සාමාන්‍ය පැයක වැටුප මෙන් 1.5 ගුණයකට නොඅඩු මුදලක් ගෙවිය යුතුය.
**S&OE පනත (RER) I කොටස, 7 (ආ) වන වගන්තිය**

සේවකයින්ට අතිකාල දීමනා ඉහළ අනුපාතයකින් ගෙවිය යුතුය.
**C.189 10(1) වන වගන්තිය; නිර්දේශ 201 වගන්ති 6(2) (c) සහ 8(1)**

රැකියා ගිවිසුමෙහි සේවකයාගේ දෛනික විවේකය සහ වැඩ කරන වේලාවන් පැහැදිලිව සඳහන් කළ යුතුය. සේවකයෙකු දිනකදී පැය 4 ක් අඛණ්ඩව වැඩෙහි යෙදවීමකින් මෙන් පසු විනාඩි 30 ක විවේකයක් ලබා දිය යුතුය.
**S&OE පනත (RHE) 9(2)වන වගන්තිය, C.189 7(f), 7(g) සහ 10(1) වන වගන්ති**

සේවකයින්ට සතිපතා එක් දිනක (අඛණ්ඩව පැය 24 ක) විවේකයක් හිමිවිය යුතුය.
**C.189 10(2) වන වගන්තිය**

නිවසේ නැවතී සිටිමින් සේවය කරනු ලබන ගෘහ සේවකයින් තමාට හිමි විවේක කාලයේදී හෝ නිවාඩු කාලයේදී සේවායෝජකයාගේ නිවසේම රැඳී සිටීම අවශ්‍ය නොවේ. **C.189 9 (ආ) වන වගන්තිය**

## 8. විවේක නිවාඩු සහ අනෙකුත් නිවාඩු

8.1 සේවකයාට දින දර්ශන වර්ෂයක් තුළ වැටුප් සහිත නිවාඩු දින 14 ක් (අනියම් සහ අසනීප නිවාඩු ඇතුළුව) හිමිවේ.

8.2 සේවකයාට මසකට දින ..................................... අනුපාතයකින් වාර්ෂික නිවාඩු සහ අසනීප නිවාඩු එක්රැස් කර ලබාගැනීමට හැකි විය යුතුය.

8.3 රජයේ නිවාඩු දින ඇතුළුව අනෙකුත් සියලුම නිවාඩු, දෙපාර්ශවය අතර අන්‍යෝන්‍ය එකඟතාවය මත තීරණය වේ.

ගෘහ සේවකයන්ට ඔවුන්ගේ කාර්යයේ අනන්‍ය ස්වභාවය සැලකිල්ලට ගනිමින්, වැඩකරන පැය ගණන, අතිකාල, විවේක සහ නිවාඩු සඳහා අනෙකුත් සේවකයන් හා සමාන සැලකිලි ලැබිය යුතුය. **C189 10(1) වන වගන්තිය**
සේවකයින්ට වැටුප් සහිත වාර්ෂික නිවාඩු දින 14ක් හිමිවේ. **S&OE පනත (RER), 6(1)(b) වන වගන්තිය**

අනෙක් සියළු සේවකයන්ට මෙන්ම ගෘහ සේවකයන්ට ද වාර්ෂිකව නිවාඩු සහ අසනීප නිවාඩු එකතු කරගනිමින් භාවිතා කිරීමට හැකි විය යුතුය. **S&OE පනත I කොටස 6 (3) වන වගන්තිය; C.189 7(g) වන වගන්තිය, නිර්දේශ, 201 6(2) b සහ 11 (3) වන වගන්ති**

ගෘහ සේවකයින්ට සියලුම රජයේ නිවාඩු දිනවල වැටුප් සහිත නිවාඩු සඳහා හිමිකම් ඇත. **S&OE පනත 7 වන වගන්තිය**

## 9. සමාජ ආරක්ෂණය

9.1 රැකියාවේදී හෝ රැකියාවට අදාළ ගමනකදී සේවකයාට සිදුවන අනතුරු හෝ අසනීප සඳහා, සේවායෝජකයා වහාම වෛද්‍ය ප්‍රතිකාර ලබා දිය යුතු අතර අවශ්‍ය වෛද්‍ය වියදම් දැරීම සහ නියමිත වන්දි ලබා දිය යුතුය.

9.2 මාතෘ නිවාඩු: කාන්තා සේවිකාවක් ගර්භිණීව සිටිනවා නම්, එම සේවිකාවට දින ......... ක් සඳහා වැටුප් සහිත මාතෘ නිවාඩු සඳහා හිමිකම් ඇති බවට ගිවිසුම් ගත පාර්ශවයන් එකඟ වේ.

ගෘහ සේවිකාවන්ට මාතෘ ප්‍රතිලාභ ඇතුළුව සමාන සමාජ ආරක්ෂණයක් තිබිය යුතුය. **C.189 14 වන වගන්තිය**

සේවකයෙකු රැකියාවේදී සිදුවන අනතුරු සඳහා සේවායෝජකයා නියමිත වන්දි ලබා දිය යුතුය. **WCO 3 කොටස**

කාන්තා සේවිකාවන්ට සති 12 ක වැටුප් සහිත මාතෘ නිවාඩු සඳහා හිමිකම් ඇත. **MB පනත 140 ඡේදය 3 වන වගන්තිය**
කාන්තා සේවිකාවන්ට සජීවී දරු ප්‍රසූතියක් වෙනුවෙන් දින 70 ක මාතෘ නිවාඩු ලබා ගත හැකිය. **SOE පනත 1A කොටස - මාතෘ ප්‍රතිලාභ, Sec 18 B(1) සහ (2) වන වගන්ති**

## 10. ජීවත්වන සහ වැඩකරන පරිසරය

10.1 සේවකයාට තම ඇඳුම් මාරු කරගැනීමට සහ තබා ගැනීමට පෞද්ගලිකව වෙන් වූ ඉඩක් ලබා දෙනු ලැබේ.

10.2 සේවායෝජකයා විසින් සේවකයාට ඔවුන්ගේ සේවා කාලය පුරාම පිරිසිදු පානීය ජලය සහ වැසිකිළි පහසුකම් සහ නිසි සනීපාරක්ෂක පහසුකම් නොමිලේ ලබා දිය යුතුය.

10.3 සේවා ස්ථානයන්හී උපද්‍රව ඉවත් කිරීමෙන් සහ අවදානම් අවම කිරීමෙන් හා නිසිලෙස නඩත්තු කිරීමෙන් සේවකයන් ආරක්ෂා කිරීම සඳහා සේවායෝජකයා සුදුසු සහ ප්‍රමාණවත් ආරක්ෂිත සහ සෞඛ්‍ය පියවරයන් ගෙන ඇතිබවට සහතික විය යුතුය.

10.4 සේවා යෝජකයා විසින් සේවකයාට එරෙහිව කිසිදු ශාරීරික, ලිංගික හා චිත්තවේගීය ප්‍රචණ්ඩත්වයක් ඇති නොවන, හිතකාමී පරිසරයක වැඩ කිරීමට සේවකයාට ඇති අයිතිය සහතික කළ යුතුය.

10.5 සේවකයාට තම ගමන් බලපත්‍ර සහ හැඳුනුම්පත් හා අනෙකුත් පෞද්ගලික භාණ්ඩ තමා සතුව තබා ගැනීමට අයිතියක් ඇත.

ගෘහ සේවකයන්ට තම පෞද්ගලිකත්වයට ගරු කරන, යහපත් සහ ආරක්ෂිත ජීවන/සේවා කොන්දේසි සඳහා අයිතියක් ඇත. **C.189, 6 වන වගන්තිය සහ 13 වන වගන්තිය**

සේවා යෝජකයින් සේවකයාට තම ඇඳුම් මාරු කරගැනීමට සහ ගබඩා කිරීම සඳහා ඉඩකඩ ලබාදිය යුතුය. **FO Part IV Sec 48(1)**

සේවායෝජකයා විසින් පිරිසිදු ජලය සහ වැසිකිළි පහසුකම් ගෘහ සේවකයාට සැපයිය යුතුය. **FO (සංශෝධනය) 12/1976 15(1), 31(1), 49 වන වගන්ති; S&OE පනත 12 වන වගන්තිය; OSH&WR රෙගුලාසි 6**

සේවායෝජකයින් විසින් සේවා ස්ථානයන්හි උපද්‍රව ඉවත් කිරීම, අවදානම් අවම කිරීම සහ ආරක්ෂිත උපකරණ, වාතාශ්‍රය, ගින්නෙන් ආරක්ෂාව සහ ප්‍රථමාධාර ලබා දීමෙන් සේවකයාගේ ආරක්ෂාව සහතික කළ යුතුය. **FO 24 සහ 25 වන වගන්ති; OSH&WR Reg 3; HOR 3 වන වගන්තිය; C.189 13 වන වගන්තිය**

ඕනෑම පසුබිමක ලිංගික හිරිහැර කිරීම අපරාධමය වරදකි. ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහය **(Sec 345)**
ප්‍රචණ්ඩත්වයකින් හා හිරිහැරයකින් තොර වැඩ පරිසරයකට සියලුම සේවකයින්ට අයිතියක් ඇත. **C.189 5 වන වගන්තිය; C.190 4, 6 සහ 7 වන වගන්ති**

සේවායෝජකයින් සේවකයින්ට ඔවුන්ගේ බඩු බාහිරාදිය සහ හැඳුනුම්පත් ලේඛන තමා සතුව තබා ගැනීමට ඉඩ දිය යුතුය. **C.189 9 (c) වන වගන්ති**

## 11. ආරවුල් විසඳීම

11.1 මෙම රැකියා ගිවිසුමෙන් පැන නගින ඕනෑම ආරවුලක් පළමුව සාමකාමී සාකච්ඡා මාර්ගයෙන් සුහදව විසඳා ගත යුතුය.

11.2 ආරවුලක් ඇති වූ විට ගෘහ සේවකයන් සඳහා වූ වෘත්තීය සමිතිවලින් සහාය ලබා ගැනීමට ගෘහ සේවකයන්ට අයිතියක් ඇත.

11.3 මෙම උත්සාහයන් අසාර්ථක වුවහොත්, ඕනෑම පාර්ශ්වයකට කම්කරු කොමසාරිස් ජනරාල්වරයාට හෝ අදාළ ප්‍රදේශයේ ඔහුගේ නියෝජිතයාට පැමිණිලි කළ හැකිය.

ඕනෑම සේවකයෙකුට රැකියා ආරවුල් කම්කරු විනිශ්චය සභාවට ඉදිරිපත් කිරීමට හෝ සමථයකට පත් කරගැනීමට අයිතියක් ඇත. කාර්මික ආරාවුල් පනත 31 ආ (1) සහ 33 (ඈ); **C189 16 වන වගන්තිය**

ගෘහ සේවකයින්ට සහාය ලබා ගැනීම සඳහා පහත සඳහන් වෘත්තීය සමිති හා සම්බන්ධ විය හැකිය:

- ප්‍රොටෙක් වෘත්තිය සමිතිය: 070 430 7003/ info@protect.lk
- වැඩ කරන කාන්තාවන් සඳහා වූ වෘත්තීය සමිති මධ්‍යස්ථානය: 071 338 6433/ centreforworkingwomen@gmail.com
- ගෘහස්ථ සහ සාමාන්‍ය සේවක සංගමය: 076 058 6807/ dgwu.gs.office@gmail.com

## 12. රැකියා ගිවිසුම අත්සන් කිරීම

12.1 සේවායෝජකයා සහ සේවකයා යන දෙදෙනාටම අනෙක් පාර්ශවයට මාසයක පූර්ව දැනුම්දීමක් ලිඛිතව ලබා දීමෙන් කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට අයිතියක් ඇත.

12.2 රැකියා ගිවිසුම උල්ලංඝනය වුවහොත් ගිවිසුම අවසන් කිරීමට සහ උල්ලංඝනය කිරීමෙන් පැන නගින වන්දි ඉල්ලා සිටීමට දෙපාර්ශවයටම අයිතියක් ඇත.

12.3 රැකියා සම්බන්ධතාවය අවසානයේ, සේවා යෝජකයා විසින් රැකියා ගිවිසුම අවසන් කරන ලද කොන්දේසි නොසලකා, සේවා කාලය සහ රැකියාවේ ස්වභාවය සඳහන් සේවා සහතිකයක් සේවකයාට ලබා දිය යුතුය.

12.4 රැකියා ගිවිසුම අවසන් කිරීමට හේතුව සේවකයාට ලිඛිතව දැනුම් දිය යුතුය. ගෘහ සේවකයා නූගත් අයෙකු නම්, සාක්ෂිකරුවෙකු ඉදිරියේ සේවායෝජකයා විසින් ඒ දැනුම්දීම වාචිකව පැහැදිලි කළ යුතුය.

12.5 සේවකයාගේ වරදකින් තොරව සේවයෙන් පහ කරනු ලැබුවහොත්, සේවකයා විසින් සම්පූර්ණ කරන ලද සේවා කාලය/මාස සඳහා ගෙවීමක් සේවකයාට ලබා දීමට සේවායෝජකයා එකඟ වන අතර, සේවා යෝජකයා විසින් ගෙවිය යුතු ගෙවීම් නොපමාව සිදු කළ යුතුය.

රැකියාව අවසන් කිරීම සඳහා වන නියමයන් රැකියා ගිවිසුමෙහි ඇතුළත් විය යුතුය.
**C189 7(k) වන වගන්තිය**

සේවායෝජකයින් සේවය අවසන් කිරීමට පෙර කම්කරු කොමසාරිස්වරයාගේ අනුමැතිය සහ සේවක අනුමැතිය ලබා ගත යුතුය.
**TEWA, 2 (1) (a) සහ (b) වන වගන්ති**

රැකියා ගිවිසුම උල්ලංඝනය වීමකදී සේවකයින්ට මෙන්ම සේවා යෝජකයින්ටද සේවය අවසන් කළ හැකි අතර ඒ පිළබඳව නීතිමය පිළියම් සෙවිය හැකිය. **C.189 16 වන වගන්තිය; ID පනත, 31B (1), 31C (1) සහ 33 වන වගන්ති**

රැකියාව අවසානයේ සේවා කාලය සහ රැකියාවේ ස්වභාවය සඳහන් කරන සේවා සහතිකයක් සේවායෝජකයා විසින් සේවකයාට ලබා දිය යුතුය.
**S&OE පනත 18 වන වගන්තිය; C.189 7(j) වන වගන්තිය**

සේවකයා සේවයෙන් පහ කිරීමට හේතුව සේවායෝජකයා විසින් ලිඛිතව සේවකයාට දැනුම් දිය යුතුය. සේවකයා නූගත් අයෙකු නම්, එය සාක්ෂිකරුවෙකු ඉදිරියේදී සේවකයාට වාචිකව පැහැදිලි කළ යුතුය. **C.189 9 වන වගන්තිය**

හේතුවක් නොමැතිව සේවයෙන් පහ කරන ලද සේවකයින්ට සියලුම නියමිත ගෙවීම් සේවායෝජකයා විසින් කඩිනමින් ලබාදිය යුතුය.
**කාර්මික ආරවුල් පනතේ 33 වන වගන්තිය;**
**C.189 11 වන වගන්තිය; නිර්දේශ 201, 15(2) වන වගන්තිය**

සේවකයෙකු සේවයෙන් ඉල්ලා අස්වන විට, සේවායෝජකයා වැඩ කරන දින දෙකක් ඇතුළත සියලුම නියමිත වැටුප් ගෙවිය යුතුය.
**S&OE පනත (RER) II කොටස, 19(1)(c) වන වගන්තිය**

## 13. සංවිධානය වීමේ අයිතිය

13.1 ගෘහ සේවකයාට වෘත්තීය සමිතියකට බැඳීමට, වෘත්තීය සමිති ක්‍රියාකාරකම් වලට සහයෝගය දැක්වීමට සහ වෘත්තීය සමිති ක්‍රියාකාරකම් වලට සහභාගී වීමට ඇති අයිතිය සේවායෝජකයා විසින් පිළිගනී.

සියලුම සේවකයින්ට බාධාවකින් තොරව වෘත්තීය සමිතිවලට සම්බන්ධ වීමට සහ සහභාගී වීමට අයිතියක් ඇත.
**TUO 2 වන වගන්ති; ID A(සංශෝධනය) 56/199, කොටස V-A, 32A වන වගන්තිය; ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, 14(1) (C) වන වගන්තිය, C.189 3 සහ 8 වන වගන්ති**

## 14. වෙනත් කොන්දේසි

14.1 මෙම රැකියා ගිවිසුමේ කිසියම් වෙනසක් වලංගු වන්නේ සේවා යෝජකයා සහ සේවකයා යන දෙදෙනාම ඒ බව ලිඛිතව සටහන්කර සහ අත්සන් කර ඇත්නම් පමණි.

## 15. ගිවිසුමේ පාර්ශවයන්ගේ අත්සන්

15.1 මෙම ගිවිසුමේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසි සමඟ සේවායෝජකයා සහ සේවකයා යන දෙදෙනාම එකඟ ව ඇත.

15.2 සේවකයා මෙම ගිවිසුමේ පිටපතක් ලැබී ඇති බව තහවුරු කරන අතර එහි අන්තර්ගතය අත්සන් කිරීමට පෙර නිසි ලෙස පැහැදිලි කර දී ඇති බව තහවුරු කරයි.

15.3 සේවා යෝජකයා විසින් ලබා දෙන රැකියාව පිළිගන්නා බවට සේවකයා සිය ප්‍රකාශිත ඇඟවීම ලබා දී සිටී.

මෙම ගිවිසුම අනුපිටපත් වලින් සකස් කර ඇත. ගිවිසුමේ පාර්ශවයන්, ගිවිසුමේ සම්පූර්ණ අන්තර්ගතය කියවා තේරුම් ගෙන පහත අත්සන් කර ඇත.

| | |
|---|---|
| ______________________ | ______________________ |
| සේවායෝජකයාගේ අත්සන | සේවකයාගේ අත්සන |
| දිනය   /   / | දිනය   /   / |
| ස්ථානය | ස්ථානය |

# ඇමුණුම්

- ගෘහ සේවකයාගේ රැකියා වර්ගය
- රැකියා විස්තරය සහ ගෘහ සේවකයාගේ රාජකාරි
- වැටුප් ගෙවීම් වාර්තා කිරීම සඳහා ආකෘතිය
- මෙම රැකියා ගිවිසුමට අදාළවන ශ්‍රී ලංකාවේ කම්කරු නීති
- මෙම රැකියා ගිවිසුමෙහි අඩංගු විධිවිධානයන්ට මඟ පෙන්වන ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්

## ඇමුණුම 1 : ගෘහ සේවකයාගේ රැකියා වර්ගය

(අදාළ රැකියා වර්ගය සළකුණු කරන්න.)

| | | | |
|---|---|---|---|
| ගෘහපාලක | ◯ | දොරටු මුරකරු | ◯ |
| සත්කාරක සේවක (වැඩිහිටි පුද්ගලයින් රැකබලා ගැනීම) | ◯ | අරැක්කැමි | ◯ |
| සත්කාරක සේවක (දරුවන් රැකබලා ගැනීම) | ◯ | උද්‍යාන කම්කරු | ◯ |
| සත්කාරක සේවක (රෝගී පුද්ගලයින් රැකබලා ගැනීම) | ◯ | රෙදි සෝදන්නා | ◯ |
| සත්කාරක සේවක (ආබාධිත පුද්ගලයින් රැකබලා ගැනීම) | ◯ | රියදුරු (ගෘහස්ථ) | ◯ |
| නිවස පිරිසිදු කරන්නා | ◯ | නිවස රැකබලා ගන්නා | ◯ |
| ...................................... (අදාළ රැකියාව මෙහි සඳහන් කරන්න) | | ...................................... (අදාළ රැකියාව මෙහි සඳහන් කරන්න) | |

පෞද්ගලික නිවාසවල ක්‍රියාකාරකම් - එක්සත් ජාතීන්ගේ සංඛ්‍යාලේඛන කොමිෂන් සභාව 2002, සියලුම ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මත

## ඇමුණුම 2 : ගෘහස්ථ සේවකයන් සඳහා සේවා විස්තරය සහ රාජකාරී ලැයිස්තුව

(කරුණාකර අදාළ රවුමේ x ලකුණ යොදන්න)

| | | | |
|---|---|---|---|
| නිවස පිරිසිදු කිරීම | ◯ | බුමුතුරුණු සහ ගෘහභාණ්ඩ යන්ත්‍ර මඟින් පිරිසිදු කිරීම | ◯ |
| වැසිකිළි, මුහුණ සෝදන/ නාන බේසම්, පිරිසිදු කිරීම | ◯ | ආහාර ඉවීම සහ පිළියෙළ කිරීම | ◯ |
| ආහාර පිළිගැන්වීම | ◯ | ආහාර ඉවීමට සහ පිළියෙළ කිරීමට සහාය වීම | ◯ |
| රෙදි සේදීම (රෙදි සෝදන යන්ත්‍ර මඟින්) | ◯ | ආහාර ගැනීම අවසන් කිරීමෙන් පසු පිරිසිදු කිරීම | ◯ |
| රෙදි සේදීම (අතින්) | ◯ | කසළ ඉවත් කිරීම | ◯ |
| රෙදි වැනීම සහ වේලීම | ◯ | එළිමහන පිරිසිදු කිරීම, බිත්ති, විදුලි පහන්, ජනෙල් ආදිය | ◯ |
| රෙදි මැදීම | ◯ | ගෙබිම් හා වැරන්ඩා ඔප දැමීම | ◯ |
| ගෙවත්ත සැකසීම/මනාව පාලනය | ◯ | වියපත් වූවන් රැකබලා ගැනීම | ◯ |
| තණකොළ කැපීම | ◯ | ළමයින් රැකබලා ගැනීම | ◯ |
| ගෙවත්ත ආශ්‍රිත පැල / ගස් කප්පාදු කිරීම | ◯ | ආබාධිත වූවන් රැකබලා ගැනීම | ◯ |
| සුරතල් සතුන් බලා ගැනීම | ◯ | රෝගීන් රැකබලා ගැනීම | ◯ |
| වාහන සේදීම | ◯ | නිවස රැකබලාගැනීම | ◯ |
| සාමාන්‍ය රියදුරු රාජකාරි | ◯ | ...................................... (අදාළ අනෙකුත් රජකාරි) | ◯ |
| ගෘහාශ්‍රිත අනෙක් සේවකයන් ගේ සේවා අධීක්ෂණය කිරීම | ◯ | | |

ඉහත සළකුණු කර ඇති/මා හට පවරන ලද රැකියා විස්තර මා තේරුම් ගෙන එයට එකඟ වන බව මම මෙයින් ප්‍රකාශ කරමි

| | |
|---|---|
| ______________________ | ______________________ |
| සේවායෝජකයාගේ නම සහ අත්සන | සේවකයාගේ නම සහ අත්සන |
| දිනය   /   / | දිනය   /   / |
| ස්ථානය | ස්ථානය |

(නියමිත ලෙස පුරවා අත්සන් කරන ලද ඉහත රැකියා විස්තරය රැකියා ගිවිසුම සමඟ අමුණා තිබිය යුතුය).

## ඇමුණුම 3 : වැටුප් ගෙවීම පිළිබඳ වාර්තාව

සේවකයාගේ නම ..................................................................................

වර්ෂය .....................................

මාසය ..................................... සතිය ..................................... (අදාළ වේ නම්)

| වැඩකරන දිනය (දෛනික ගෙවීම් සඳහා) (කරුණාකර අදාළ සතිය හෝ මාසය අදාළ වන පරිදි සඳහන් කරන්න) | පැයකට/ දිනකට වැටුප් අනුපාතය | වැඩ කළ පැය ගණන | අතිකාල පැය ගණන (දිනකට පැය 08 ඉක්මවීම) | ගෙවිය යුතු දළ වැටුප් රු. | අනෙක්නය වශයෙන් එක වූ අඩු කිරීම් තිබේ නම් රු. | ගෙවන ලද වැටුප් ශුද්ධ ප්‍රමාණය රු. | ගෙවීමේ දිනය | සේවකයාගේ අත්සන | සේවායෝජකයාගේ අත්සන |
|---|---|---|---|---|---|---|---|---|---|
| **සඳුදා** | | | | | | | | | |
| **අඟහරුවාදා** | | | | | | | | | |
| **බදාදා** | | | | | | | | | |
| **බ්‍රහස්පතින්දා** | | | | | | | | | |
| **සිකුරාදා** | | | | | | | | | |
| **සෙනසුරාදා** | | | | | | | | | |
| **ඉරිදා** | | | | | | | | | |

ඉහත දක්වා ඇති ලෙස ................................ වර්ෂයේ ................................ මාසය සඳහා වූ මාගේ මාසික / සතිපතා වැටුප මට ලැබුණු බව මෙයින් සනාථ කරමි.

සේවකයාගේ නම සහ අත්සන ......................................... දිනය ................................

සේවායෝජකයාගේ නම සහ අත්සන ................................ දිනය ................................

## ඇමුණුම 4 : මෙම රැකියා ගිවිසුමට අදාළ වන ශ්‍රී ලංකාවේ කම්කරු නීති

- ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීම පිළිබඳ පනත, 1956 අංක 47 සහ සංශෝධිත පනත් EWY&C
- 2021/1 අන්තරායකාරී සේවා නියෝග (HOR)
- කර්මාන්ත ශාලා ආඥා පනත 1976 අංක 12 සහ සංශෝධිත පනත් (FO)
- කාර්මික ආරවුල් පනත (1999 අංක 56 දරණ සංශෝධිත පනත) (ID පනත)
- වෘත්තීය ආරක්ෂාව, සෞඛ්‍ය සහ සුභසාධන රෙගුලාසි 1984 (OSH&WR)
- ප්‍රසූතිකාධාර පනත 1939 අංක 32, 2018 අංක 15 මාතෘ ප්‍රතිලාභ (සංශෝධන) පනත,
- 2024 අංක 48 දරන කම්කරුවන්ගේ ජාතික අවම වැටුප් (සංශෝධන) පනත (NMWW පනත)
- 1954 අංක 19 දරන සාප්පු සහ කාර්යාල සේවක පනත, සංශෝධිත (S&OE පනත) යටතේ රැකියා සහ වේතන නියාමනය (RER), රැකියා වේලාවන් නියාමනය කිරීම (RHE)
- 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රැකියා අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සහ සංශෝධිත පනත් (TEWA)
- 1990 අංක 15 දරන කම්කරු වන්දි (සංශෝධිත ආඥාපනත) (WCO)
- 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥාපනත (TUO)
- 1883 අංක 2 දරන ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහය (දණ්ඩ නීති සංග්‍රහය)
- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව)

## ඇමුණුම 5 : රැකියා ගිවිසුමෙහි විධිවිධානයන්ට මඟ පෙන්වන ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන්

- ගෘහ සේවක සම්මුතිය, 2011 (අංක 189) - C.189
- ගෘහ සේවක නිර්දේශයන්, 2011 (අංක 201) - R 201
- ප්‍රචණ්ඩත්වය සහ හිරිහැර සම්මුතිය, 2019 (අංක 190) - C.190
- ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය, 1989 - CRC
- සංවිධානය වීමේ නිදහස සහ අයිතිය ආරක්ෂා කිරීමේ සම්මුතිය, 1948 (අංක 87) - C.87
- අවම වයස පිළිබඳ සම්මුතිය, 1973 (අංක 138)
- ළමුන් අන්තරාකාරීය රැකියාවන්හි යෙදවීම පිළිබඳ සම්මුතිය, 1999 (අංක 182) - C.182
- සමාන වේතන සම්මුතිය, 1951 (අංක 100) - C.100
- වෙනස්කොට සැලකීම (රැකියාව සහ වෘත්තීන්) සම්මුතිය, 1958 (අංක 111) - C.111